**බේරුවල ප්‍රාදේශීය සභාව - 2022**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බේරුවල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බේරුවල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රමිතයේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | රු.675,000 ක ස්ථාවර තැන්පත් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොළී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව | පොලි ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2020 හා 2021 වර්ෂවල රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදානවල වාර්ෂික ක්ෂය කිරිම්වලට සමාන ප්‍රමාණයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ අයභාර ලෙස හඳුනාගෙන නොතිබුණි. | විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් අංක 10 යටතේ දක්වා ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරිමේ මාර්ගෝපදේශය | ඉඩම් හා ගොඩනැගිලි වෘත්තීය තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කරවා ගතයුතු වුවත්, සභාව විසින් පත්කළ කමිටුවක් මගින් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරුව සිදු කර තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා තක්සේරු වටිනාකම ලබා ගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.1,640,489 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.75,271,564 විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 23,854,295 | 29,253,576 | 19,633,435 | 25,754,967 | 27,497,375 | 28,668,148 | 20,299,363 | 29,855,526 |
| (ii) | කුලි | 22,921,850 | 20,825,028 | 23,330,393 | 5,952,825 | 18,780,360 | 21,774,627 | 17,074,308 | 7,517,574 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,130,000 | 4,102,000 | 3,893,040 | 898,500 | 1,081,500 | 907,382 | 704,382 | 261,000 |
| (iv) | වෙනත් ආදායම් | 100,000,000 | 152,309,224 | 189,838,595 | 115,798,726 | 110,850,000 | 110,850,000 | 90,220,000 | 20,630,000 |
| | | 150,906,145 | 206,489,828 | 236,695,463 | 148,405,018 | 158,209,235 | 162,200,157 | 128,298,053 | 58,264,100 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වර්ෂයකට අඩු හිඟය රු.2,754,108 ක්ද, වර්ෂ 01-03 අතර හිඟය රු.8,985,427 ක්ද, වර්ෂ 03-05 අතර හිඟය රු.4,638,278 ක්ද, වර්ෂ 05-10 අතර හිඟය රු.9,388,228 හා වර්ෂ 10 යට වැඩි හිඟය රු.8,189,417 ක් විය. | වරිපනම් අයවීම සම්බන්ධ සමීක්ෂණයක් සිදු කිරිමට කටයුතු යොදා ඇති අතර එම වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරිමට සැලසුම් කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට කඩ කුලී හිඟය රු.7,517,572 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු,2.610,387 හෙවත් සියයට 35 ක් අයකර ගෙන නොතිබුණි. | කඩ කාමර වසා තැබීම නිසා හිඟය ලේඛනවලින් කපා හැරීමට ද ඉතිරි මුදල් අයකර ගැනීමට නඩු පැවරීමට කටයුතු කර ඇති බව. | -එම- |
| (ඇ) අළුත්ගම , සති පොල සිල්ලර කඩ කාමර 10 ක්ද, එළවළු කඩ කාමර 15 ක්ද, මග්ගොන පොදු වෙළඳපොල කඩ කාමර 11 ක්ද, දර්ගා නගරයේ කඩ කාමර 09 ක් ද බදු දීමකින් තොරව වසර ගණනාවක සිට වසා දමා තිබීම නිසා සභාවට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි. | කඩ කාමරවල පවතින ගැටළු නිසා ජනතාව අඩු බැවින් භාවිතයෙන් තොරව පවතින බව. | ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2022 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.51,592,795 ක් හා මුද්දර ගාස්තු රු.34,995,067 ක් විය. | උප ලේඛන සකස් කල පසු පළාත් ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර දඩ මුදල් හා මුද්දර ගාස්තු ගාස්තු ලබා ගැනීම සිදු කර ඇති බව. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කර්මාන්ත අමුද්‍රව්‍ය මිලදී ගැනීමට පෙර නඩත්තු කළ යුතු මාර්ග සැලැස්මක් සකස් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.1,669,000 ක් වූ තාර හා කෝලාස් බැරල් 54 ක් මිලදී ගෙන තිබුණි. | 2023 වර්ෂය සඳහා නඩත්තු වැඩ සටහන් පිළියෙල කිරීමට කටයුතු කර ඇති බව. | නඩත්තු සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මුහුදුබඩ ප්‍රදේශය ආසන්නයේ ඉදිකර තිබුණු පයාගල කායවර්ධන මධ්‍යස්ථානයේ උපකරණ 2017 වර්ෂයේ සිට සේවා කිරිමක් හෝ නඩත්තු කිරිමක් සිදු කර නොතිබූ බැවින් සියළුම යන්ත්‍රෝපකරණ දැඩි ලෙස මල බැඳිමකට ලක්වී තිබුණි. | පයාගල හා මග්ගොන කායවර්ධන මධ්‍යස්ථාන දෙක මුහුදුබඩ ප්‍රදේශය ආසන්නයේ ඇති බැවින් ලවණ මිශ්‍ර වාතයට නිතර නිරාවරනය වන බැවින් මල බැඳීම සිදු වන බව. | කායවර්ධන මධ්‍යස්ථානයේ උපකරණ නඩත්තු කිරිමක් සිදු කළ යුතුය. |
| (ආ) සභාව සතු ඉඩම් 191 ක නීත්‍යානුකූල හිමිකම සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතනවල පවතින ඉඩම් ගැටළු විසඳීම යටතේ ප්‍රාදේශිය ලේකම් විසින් වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා ගැටළු සියල්ල ඉදිරිපත් කර ඇති බව. | සභාව සතු ඉඩම්වල නිත්‍යානුකූල හිමිකම සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) සභාව සතු ඉඩම් කැබලි 117 කට අදාලව නිත්‍යානුකූලව අයිතිය තහවුරු වන ලේඛන නොමැතිවීම හේතුවෙන් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා විධිමත් තක්සේරුවක් සිදු කරවා ගැනීමට නොහැකිව තිබුණි. | ප්‍රාදේශිය ලේකම් විසින් ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන් මගින් මේ සම්බන්ධයෙන් කටයුතු කරන අතර එම වැඩ සටහන යටතේ ගැටළු විසඳු පසු තක්සේරු දෙපාර්තමේන්තුව ලවා විධිමත් තක්සේරුවක් සිදු කරන බව. | ඉඩම් විධිමත් පරිදි තක්සේරු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද රු.2,502,000 ක් වූ ව්‍යාපෘති 03 සඳහා නිර්මාණ සැලසුම් හා මිණුම් පත්‍ර සකස් කර නොතිබුණි. | සම්පූර්ණයෙන්ම නව ඉදි කිරිමක් නොවන නිසා නිර්මාණ සැලසුම් ඉදිරිපත් කර නොමැති බව. | නිර්මාණ සැලසුම් හා මිණුම්පත්‍ර සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) අළුත්ගම දුම්රිය මාර්ගයට සමාන්තර පාර අවසන් කොටස කොන්ක්‍රිට් කිරිමේදී කොන්ක්‍රිට් තට්ටුවේ ඝණකම මි.මි.125 ලෙස ඇස්තමේන්තු කර තිබුණද, කොන්ක්‍රිට් ඇතිරීමේදී එය මි.මි.120 ඝනකමට සිදු කර තිබියදීත් අදාල මුදල් අඩුකර ගෙවීම් කර තිබුණි. මෙලෙස මාර්ගයේ ප්‍රමිතිය අඩුවීම නිසා ස්ථාන දෙකක කොන්ක්‍රිට් තට්ටුවේ පිපිරීම් තිබුණි. | ප්‍රාදේශිය මාර්ගයක් නිසා ප්‍රමිතිය අඩුවීමක් සිදු වී නොමැති බව හා සුළු පිපිරීම් ස්ථාන අළුත්වැඩියා කළ යුතුව පවතින බව. | ගෙවීම් කිරීමේදී ඉදිකිරීම්වල ප්‍රමිතිය සැළකිල්ලට ගත යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ සභිකයන්ගේ අවශ්‍යතාවය මත එකතුව රු.11,037,000 ක් වූ ව්‍යාපෘති 13 ක් ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් නොකර සහ අයවැය අනුමැතියකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. | මෙම ව්‍යාපෘති 13 ක්‍රියාත්මක කර ඇත්තේ ප්‍රමුඛතා පදනම මත පිහිටා බව. | අයවැය අනුමැතිය ලබාගත යුතුය. |

4. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂය සඳහා කසළ කළමනාකරණ සැලැස්මක් සකස් කර තිබුණද, එම සැලැස්ම තුළ රැස් කරන කසළ කොම්පෝස්ට් කිරීම හා නොදිරන කසළ ප්‍රතිචක්‍රීකරනය කිරීම වැනි වැඩ සටහන් ඇතුළත් කර නොතිබීම නිසා බාහිර පාර්ශවයක් සතු ඉඩමකට කසළ දමා පස්වලින් වැසීම සිදු කර තිබු අතර ඒ සඳහා 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු.8,734,830 ක් වැය කර තිබුණි. | කසළ විධිමත්ව බැහැර කිරිමට ඉඩම් නොමැති බැවින් මෙසේ කිරීමට සිදු වූ බව. | කසළ බැහැර කරලීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |